# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2199/9 - 2020 ඔක්තෝබර් මස 27 වැනි අඟහරුවාදා - 2020.10.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ නිවේදන

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධි විධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු සංශෝධිත නගර සභා ආඥා පනතේ (255 අධිකාරිය) 184(1) (1අ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර නීතිඥ ලලිත් යූ. ගමගේ වන මම තලවාකැලේ ලිඳුල නගර සභාවේ සභාපතිවරයා විසින් සංශෝධිත නගර සභා ආඥා පනතේ (255 අධිකාරිය) 184 (1) වගන්තියේ සඳහන් වැරදි කිසිවක් සිදුකර ඇත්තේ ද යන්න පිළිබඳව මෙම දැන්වීමේ දින සිට මාස තුනක කාල සීමාවක් ඇතුළත පරීක්ෂා කොට මා වෙත වාර්තා කිරීම සඳහා විශ්‍රාමලත් අධිකරණ නිලධාරිණී සරෝජිනී කුසලා වීරවර්ධන මහත්මිය මෙයින් පත් කරමි.

මෙම නිලධාරිණියට මෙම පරීක්ෂණයට අදාලව පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරන ලද කොමිෂමක බලතල ඇත්තේය.

නීතිඥ ලලිත් යූ. ගමගේ,<br>
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර.

2020 ඔක්තෝබර් මස 26 වන දින,<br>
මහනුවර දී ය.

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ නිවේදන

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධි විධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු සංශෝධිත නගර සභා ආඥා පනතේ (255 අධිකාරිය) 184(1) (1ආ) (අ) (i) වගන්තිය යටතේ කරනු ලබන නියමය.

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධි විධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු සංශෝධිත නගර සභා ආඥා පනතේ (255 අධිකාරිය) 184(1) (1ආ) (අ) (i) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර නීතිඥ ලලිත් යූ. ගමගේ වන මම තලවාකැලේ ලිඳුල නගර සභාවේ සභාපති වන අනගිපුර අශෝක සේපාල මහතා එම ධුරය දැරීම වහාම ක්‍රියාත්මක වන පරිදි තාවකාලිකව අත්හිටුවමි.

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධි විධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු සංශෝධිත නගර සභා ආඥා පනතේ (255 අධිකාරිය) 184(1) (1ආ) (අ) (i) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වහාම ක්‍රියාත්මක වන පරිදි මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, තලවාකැලේ ලිඳුල නගර සභාවේ සභාපතිවරයාගේ කාර්යයන් ඉටු කිරීමට හා එහි බලතල ක්‍රියාත්මක කිරීමට නුවරඑළිය දිස්ත්‍රික්කයේ තලවාකැලේ ලිඳුල නගර සභාවේ දැනට උප සභාපති ධුරයේ කටයුතු කරනු ලබන ලෙච්චුමන් භාරතිදාසන් මහතාට නියෝග කරමි.

නීතිඥ ලලිත් යූ. ගමගේ,
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර.

2020 ඔක්තෝබර් මස 26 වන දින,
මහනුවර දී ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.